85429

AL/2007/21-S-II

[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
[All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2007 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2007 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2007

ආර්ථික විද්‍යාව II (I කොටස)
பொருளியல் II (பகுதி I)
Economics II (Part I)

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

විභාග අංකය :..............................

සැලකිය යුතුයි :

※ මෙම කොටසේ ප්‍රශ්න **20** ක් ඇත. ඒ සියලු ම ප්‍රශ්න අනිවාර්ය වේ.
※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් ලැබෙන අතර, මුළු කොටසට ලකුණු **40** ක් හිමි වේ.
※ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතුයි.
※ එක් බහුවරණ ප්‍රශ්නයකට ඇත්තේ එක් නිවැරදි පිළිතුරක් පමණි. එම පිළිතුර හඳුනාගෙන පිළිතුරට යටින් ඉරක් අඳින්න.
※ නියමිත කාලය අවසන් වූ විට **I** හා **II** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා භාර දිය යුතුයි.

---

1. පහත සඳහන් දෑ අතුරෙන් වඩාත් ද්‍රවශීල දෙය
   (i) ඉල්ලුම් තැන්පතු වේ.
   (ii) භාණ්ඩාගාර බැඳුම්කර වේ.
   (iii) ඉතුරුම් තැන්පතු වේ.
   (iv) චෙක්පත් වේ.
   (v) නිශ්චල දේපොළ වේ.

2. ඔබ විසින් රුපි. 2,000 ක් බැංකු පද්ධතියේ එක් වානිජ බැංකුවක ඉල්ලුම් තැන්පතුවක් ලෙස තැන්පත් කරනු ලැබේ යයි සලකන්න. තවද, එම බැංකුව හැමවිටම තම තැන්පතු වලින් 20% ක් සංචිතය වශයෙන් තබා ගනී. ඔබේ තැන්පතුවේ සෘජු ප්‍රතිඵලයක් වශයෙන් නව තැන්පතු කෙතරම් ප්‍රමාණයකින් වැඩි කිරීමට එම බැංකුවට හැකියාව තිබේ ද?
   (i) රුපි. 200
   (ii) රුපි. 400
   (iii) රුපි. 1,600
   (iv) රුපි. 8,000
   (v) රුපි. 10,000

3. මුදල් භාවිතය නිසා ණය ගැනීම සහ ණය ආපසු ගෙවීම වඩාත් පහසු වෙයි. මුදල් විසින් ඉටුකරනු ලබන මෙම කාර්යය හඳුන්වනු ලබන්නේ
   (i) වටිනාකමේ සන්නිධියක් ලෙසයි.
   (ii) විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙසයි.
   (iii) ගිනුම් ඒකකයක් ලෙසයි.
   (iv) වටිනාකම පිළිබඳ මිණුමක් ලෙසයි.
   (v) හුවමාරු මාධ්‍යයක් ලෙසයි.

4. කුටුම්බ සහ ව්‍යාපාරික අංශය විසින් ඉල්ලුම් කරනු ලබන මුදල් ප්‍රමාණය
   (i) ආදායම වැඩිවන විට වැඩිවන අතර පොලී අනුපාතික ඉහළ යන විට අඩු වේ.
   (ii) ආදායම හා පොලී අනුපාතික ඉහළ යන විට වැඩි වේ.
   (iii) ආදායම වැඩිවන විට අඩුවන අතර පොලී අනුපාතික ඉහළ යන විට වැඩිවේ.
   (iv) ආදායම හා පොලී අනුපාතික ඉහළ යන විට අඩු වේ.
   (v) ආදායම ඉහළ යන විට නොවෙනස්ව පවතින අතර පොලී අනුපාතික ඉහළ යන විට අඩු වේ.

[ 2 වැනි පිටුව බලන්න.

www.pastpaperlk.com
www.artsapi.lk

5. මහ බැංකුව රුපියල් මිලියන 100 ක් වටිනා සුරැකුම්පත් විවෘත වෙළෙඳපොළෙන් මිලදී ගනු ලැබුවේයයි සලකමු. සංචිත අවශ්‍යතාව 20% ක් සහ සියළුම බැංකු ශුන්‍ය අධි සංචිත තත්ත්වයක් යටතේ කටයුතු කරනවා නම්, බැංකු ඉහත ක්‍රියාව නිසා මුදල් සැපයුම මත ඇතිවන සමස්ත බලපෑම වනුයේ

(i) මුදල් සැපයුම රුපි. මිලියන 100 කින් අඩුවීමයි.
(ii) මුදල් සැපයුම රුපි. මිලියන 500 කින් අඩුවීමයි.
(iii) මුදල් සැපයුම රුපි. මිලියන 100 කින් වැඩිවීමයි.
(iv) මුදල් සැපයුම රුපි. මිලියන 200 කින් වැඩිවීමයි.
(v) මුදල් සැපයුම රුපි. මිලියන 500 කින් වැඩිවීමයි.


6. නාමික පොලී අනුපාතිකය 16% ක් ද උද්ධමන අනුපාතිකය 20% ක් ද වේ නම් මූර්ත පොලී අනුපාතිකය

(i) – 4% කි.
(ii) 4% කි.
(iii) 16% කි.
(iv) 20% කි.
(v) 36% කි.

7. පහත සඳහන් කරුණු අතුරෙන් ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයට හේතුවක් වන්නේ කවරක් ද?

(i) ඛනිජ තෙල් මිලෙහි සීඝ්‍ර ඉහළ යාමක්
(ii) වෘත්තීය සමිති විසින් ඉහළ වැටුප් දිනා ගැනීමක්
(iii) මහ බැංකුව විසින් විවෘත වෙළෙඳ පොලෙහි රජයේ සුරැකුම්පත් මිලදී ගැනීමක්
(iv) මහ බැංකුව විසින් විවෘත වෙළෙඳ පොලෙහි රජයේ සුරැකුම්පත් විකිණීමක්
(v) රජය විසින් මිල දී ගනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රමාණයෙහි අඩුවීමක්

8.




කිසියම් භාණ්ඩයක් සඳහා ඇති දේශීය වෙළෙඳ පොල ඉහත ප්‍රස්තාරය පෙන්නුම් කරයි. එම භාණ්ඩය මත දැනට පනවා ඇති ආනයන තීරුබදු ඉහළ දමනු ලැබූ විට, ආනයන මිල $OP_1$ සිට $OP_2$ දක්වා වැඩි වේ. තීරුබදු ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආනයනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණයේ අඩුවීම

(i) VW වේ.
(ii) WY වේ.
(iii) XZ වේ.
(iv) (VZ) – (WY) වේ.
(v) (VZ) – (VX) වේ.

www.pastpaperlk.com
www.artsapi.lk

9. පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් පවතින විට
(i) විනිමය අනුපාතිකයට බලපෑම් කිරීම සඳහා රජය මැදිහත් වෙයි.
(ii) විදේශ විනිමය සඳහා ඇති ඉල්ලුම හා සැපයුම සමාන කිරීමට විනිමය අනුපාතිකය හැඩ ගැසිය යුතු ය.
(iii) ගෙවුම් ශේෂය හැමවිටම අතිරික්තයක් පෙන්නුම් කළ යුතු ය.
(iv) ගෙවුම් ශේෂය හැමවිටම රජයේ අයවැය ලේඛනයට සමාන විය යුතු ය.
(v) ව්‍යවහාර මුදලේ බාහිර අගය හැමවිට ම ඉහළ යනු ඇත.

10. ඉන්දියාවේ සහ බංග්ලාදේශයේ ශ්‍රමිකයකු පැයකදී කරනු ලබන නිමැවුම් ප්‍රමාණ පිළිබඳ කල්පිත දත්ත පහත දක්වෙන වගුවෙහි පෙන්නුම් කෙරේ.

| රට | පාන් | පැන්සල් |
|---|---|---|
| ඉන්දියාව | 8 | 4 |
| බංග්ලාදේශය | 8 | 2 |

මෙම දත්තවලට අනුව ඉන්දියාව සහ බංග්ලාදේශය අතර පවතින නිදහස් වෙළෙඳම සම්බන්ධයෙන් පහත දක්වෙන ප්‍රකාශවලින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ කවරක් ද?
(i) ඉන්දියාව පැන්සල් අපනයනය කරන අතර, බංග්ලාදේශය පාන් අපනයනය කරයි.
(ii) ඉන්දියාව පාන් අපනයනය කරන අතර, බංග්ලාදේශය පැන්සල් අපනයනය කරයි.
(iii) ඉන්දියාව පාන් සහ පැන්සල් යන භාණ්ඩ දෙකම අපනයනය කරයි.
(iv) බංග්ලාදේශය පාන් සහ පැන්සල් යන භාණ්ඩ දෙකම අපනයනය කරයි.
(v) ඉන්දියාව පැන්සල් අපනයනය කරන අතර, පාන් නිෂ්පාදනය පිළිබඳ සාපේක්ෂ වාසියක් කිසිදු රටකට නොමැති බැවින් පාන් පිළිබඳව වෙළෙඳමක් හට නොගනී.

11. ශ්‍රී ලංකා රුපියලෙහි ක්ෂයවීමක්
(i) විදේශීය සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණීම අධෛර්යමත් කරයි.
(ii) ශ්‍රී ලාංකික භාණ්ඩ මිලදී ගැනීමෙහි ලා විදේශීය පාරිභෝගිකයන් අධෛර්යමත් කරයි.
(iii) විදේශීය ව්‍යවහාර මුදලක් මිලදී ගැනීමට අවශ්‍ය කරන රුපියල් ප්‍රමාණය අඩු කරයි.
(iv) විදේශීය භාණ්ඩ වැඩි වැඩියෙන් මිලදී ගැනීමෙහි ලා ශ්‍රී ලාංකිකයන් ධෛර්යමත් කරයි.
(v) ශ්‍රී ලාංකික භාණ්ඩ වැඩි වැඩියෙන් මිලදී ගැනීමෙහි ලා විදේශිකයන් ධෛර්යමත් කරයි.

12. ශ්‍රී ලංකාවට වාසිදායක අයුරින් සිදුවන වෙළෙඳ අනුපාතයෙහි වෙනසක් පැහැදිලි කළ හැක්කේ
(i) යුරෝපා සංගමය වෙත යවනු ලබන ශ්‍රී ලාංකික අපනයන පහළ යාමක් ලෙස ය.
(ii) විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකා රුපියලෙහි වටිනාකම අඩු වීමක් ලෙස ය.
(iii) ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් ලෙස ය.
(iv) ශ්‍රී ලංකාවේ අපනයන මිලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ආනයන මිල පහළ වැටීමක් ලෙස ය.
(v) ශ්‍රී ලංකාවේ අපනයන ඉපයීම් ඉහළ යාමක් ලෙස ය.

13. ලෝක බැංකුවේ වර්ගීකරණයට අනුව අඩු ආදායම් රටවල් ලෙස වර්ග කරනුයේ වාර්ෂික ප්‍රතිශීර්ෂ ආදායම
(i) ඇ.එ.ජ. ඩොලර් 675 ට අඩු රටවල් ය.
(ii) ඇ.එ.ජ. ඩොලර් 875 ට අඩු රටවල් ය.
(iii) ඇ.එ.ජ. ඩොලර් 1000 ට අඩු රටවල් ය.
(iv) ඇ.එ.ජ. ඩොලර් 1300 ට අඩු රටවල් ය.
(v) ඇ.එ.ජ. ඩොලර් 3465 ට අඩු රටවල් ය.

14. වර්තමාන ශ්‍රී ලංකාවේ උපතේදී ආයු අපේක්ෂාව සහ වැඩිහිටි සාක්ෂරතාව පිළිවෙළින්
(i) අවුරුදු 76 සහ 94% කි.
(ii) අවුරුදු 74 සහ 92% කි.
(iii) අවුරුදු 70 සහ 90% කි.
(iv) අවුරුදු 70 සහ 94% කි.
(v) අවුරුදු 68 සහ 90% කි.

www.pastpaperlk.com www.artsapi.lk

15. කිසියම් රටක සියළුම ආදායම් උපයන්නන් එක හා සමාන ආදායම් මට්ටමක් උපයනු ලැබුවේ නම්, ආදායම් ව්‍යාප්තියේ ගිනි සංගුණකය
   (i) 0.0 ක් වනු ඇත.
   (ii) 0.5 ක් වනු ඇත.
   (iii) 1.0 ක් වනු ඇත.
   (iv) 1.0 ට වැඩි වනු ඇත.
   (v) අපරිමිත වනු ඇත.

16. පහත සඳහන් දෑ අතුරෙන් සංවර්ධනය වන රටවල් සඳහා සකසනු ලබන "මානව දරිද්‍රතා දර්ශකයේ" සංඝටකයක් නොවන්නේ කුමක් ද?
   (i) උපතේ දී වයස අවුරුදු 40 දක්වා ජීවත් නොවේයයි අනුමාන කෙරෙන සංඛ්‍යාව
   (ii) වයසට සරිලන බර ප්‍රමාණය නොමැති ළමයින් සංඛ්‍යාව
   (iii) ආරක්ෂිත පානීය ජලය අඛණ්ඩව ලබාගත නොහැකි ජනගහනයේ ප්‍රමාණය
   (iv) සාක්ෂරතාව නොමැති වැඩිහිටි ජනගහනය
   (v) ආදායම් දරිද්‍රතා ඉමට (රේඛාවට) පහළින් සිටින ජනගහනයේ ප්‍රමාණය

17. කිසියම් රටක වැඩකරන වයසේ ජනගහනයේ ප්‍රමාණය මිලියන 130 ක් ද, සේවා නියුක්ති ජනගහනයේ ප්‍රමාණය මිලියන 90 ක් ද, විරැකියාවෙන් සිටින ජනගහනයේ ප්‍රමාණය මිලියන 10 ක් ද වේ. එම රටේ විරැකියා ප්‍රතිශතය කොපමණ ද?
   (i) 5.0% කි.
   (ii) 7.1% කි.
   (iii) 7.7% කි.
   (iv) 10.0% කි.
   (v) 13.0% කි.

18. සාර්ව ආර්ථික ප්‍රතිපත්තියේ අරමුණක් ලෙස අභ්‍යන්තර සමතුලිතතාව පවත්වා ගැනීම යන්නෙන් අදහස් වන්නේ
   (i) පූර්ණ සේවා නියුක්තිය සහ මිල ස්ථායිතාව අත්කර ගැනීමයි.
   (ii) පූර්ණ සේවා නියුක්තිය හා ගෙවුම් ශේෂ සමතුලිතාව ඇති කිරීමයි.
   (iii) අපනයන හා ආනයන අතර සමානත්වයක් ඇති කිරීමයි.
   (iv) ඉතුරුම් හා ආයෝජන අතර සමානත්වයක් ඇති කිරීමයි.
   (v) මිල ස්ථායිතාව හා විනිමය අනුපාතිකයේ ස්ථායිතාව අත්කර ගැනීමයි.

19. "තිරසාර සංවර්ධනය" සංකල්පය හොඳින් නිර්වචනය වනුයේ පහත සඳහන් කවර ප්‍රකාශයකින් ද?
   (i) වර්තමානයේ දී මෙන් ම අනාගතයේ දීත් ඉතාමත් ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් අත්කර ගැනීම
   (ii) පරිසරය ආරක්ෂා කර ගැනීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
   (iii) අනාගත පරපුරට තම වුවමනා සපුරා ගැනීමට ඇති හැකියාවට හානියක් නොකොට වර්තමාන පරපුරේ වුවමනා සපුරා ගැනීම
   (iv) හිඟකම පිළිබඳ ආර්ථික ප්‍රශ්නය අනාගතයේ දී මුලිනුපුටා දැමීම
   (v) අනාගත හා වර්තමාන පරම්පරාවන්හි නිරපේක්ෂ දරිද්‍රතාවය අඩුකිරීම.

20. ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානයේ (OECD) සාමාජිකයන් වනුයේ
   (i) ඉහළ ආදායම් සහිත කාර්මික රටවල් වේ.
   (ii) ඉහළ ආදායම් සහිත ඛනිජතෙල් අපනයනය කරන රටවල් වේ.
   (iii) අළුතින් කාර්මීකරණය වූ සිංගප්පූරුව, මැලේසියාව වැනි රටවල් වේ.
   (iv) පරිවර්තන ආර්ථිකයන් සහිත නැගෙනහිර යුරෝපා රටවල් වේ.
   (v) උතුරු ඇමෙරිකාවේ සහ යුරෝපයේ ඉහළ ආදායම් සහිත රටවල් වේ.

* * *

www.pastpaperlk.com
www.artsapi.lk

85429

AL/2007/21-S-II

සියලුම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
[All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2007 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2007 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2007

ආර්ථික විද්‍යාව II (II කොටස)
பொருளியல் II (பகுதி II)
Economics II (Part II)

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

අයදුම්කරුවන්ට උපදෙස් :

* "අ" උප කොටසින් ප්‍රශ්න දෙකක් ද,
* "ආ" උප කොටසින් ප්‍රශ්න දෙකක් ද, තෝරා ගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## "අ" කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

**1.** (i) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය පිළිබඳ කල්පිත දත්ත කිහිපයක් පහත දැක්වේ.

| අයිතමය | රුපියල් බිලියන |
|---|---|
| මහජනයා සතු ව්‍යවහාර මුදල් | 150 |
| වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් | 20 |
| මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු | 80 |
| වාණිජ බැංකුවල ඇති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 120 |
| වාණිජ බැංකුවල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු | 600 |
| දේශීය තැන්පතු වගකීම් ලෙස සලකනු ලබන අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් | 125 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි නේවාසිකයන් සතු තැන්පතු | 75 |
| මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් | 100 |
| ලියාපදිංචි මූල්‍ය සමාගම්වල මහජනයා සතු තැන්පතු | 90 |

මෙම දත්ත ඇසුරෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) පදනම් මුදල් (සංචිත මුදල්)
(ආ) පටු මුදල් සැපයුම ($M_1$)
(ඉ) පුළුල් මුදල් සැපයුම ($M_2$)
(ඊ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) (ලකුණු 04 යි)

(ii) බැංකු පද්ධතිය තුළ සිටින එක් වාණිජ බැංකුවක සරල ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

| වගකීම් (රුපි. මිලියන) | | වත්කම් (රුපි. මිලියන) | |
|---|---|---|---|
| තැන්පතු | 100,000 | සංචිත | 22,000 |
| | | සුරැකුම්පත් | 38,000 |
| | | ණය | 40,000 |
| එකතුව | 100,000 | එකතුව | 100,000 |

(අ) සංචිත අනුපාතය 20% ක් වේ නම් මෙම බැංකුවට අළුත් ණය උපරිම වශයෙන් කොතරම් ප්‍රමාණයක් ලබාදිය හැකි ද? (ලකුණු 02 යි)

(ආ) එම අළුත් ණය ප්‍රමාණය නිකුත් කළ පසුව බැංකුවේ ශේෂ පත්‍රය සකස් වන ආකාරය පෙන්වන්න. (ලකුණු 03 යි)

(ඉ) අළුතින් ලබාදුන් මුළු ණය ප්‍රමාණයම සඳහා ලියන ලද චෙක්පත් සියල්ලක්ම වෙනත් බැංකුවල තැන්පත් වුවහොත් මෙම බැංකුවේ ශේෂ පත්‍රය සැකසෙන ආකාරය පෙන්වන්න. (ලකුණු 03 යි)

(iii) බැංකු පද්ධතියේ මුදල් මැවීමේ විභවතාව සීමා කරමින් වාණිජ බැංකු පද්ධතියෙන් මුදල් පිටතට කාන්දුවී යා හැකි ප්‍රධාන මූලාශ්‍ර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

2. (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යයන් කවරේ ද? (ලකුණු 05

(ii) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළෙහි පොලී අනුපාතික සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෙ
අනුපාතික කොරිඩෝවක් සකසා ඇත්තේ කෙසේ ද? (ලකුණු 05

(iii) පිළින පත් මිල අඩුවන්නේ නම් පුද්ගලයන් ළඟ තබා ගැනීමට කැමැති මුදල් ශේෂ ප්‍රමාණය අඩු කරනු ලැබේ
නැතහොත් වැඩිකරනු ලැබේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 05

3. (i) නෝර්වේ හා ස්වීඩනය යන දෙරටෙහි ශ්‍රම ඒකකයකට නිපදවිය හැකි ගණක යන්ත්‍ර හා ජංගම දුරකථන ප්‍රමා
පිළිබඳ කල්පිත දත්ත පහත දී ඇත.

| රට | ගණක යන්ත්‍ර | ජංගම දුරකථන |
|---|---|---|
| නෝර්වේ | 2 | 1 |
| ස්වීඩනය | 4 | 1 |

(අ) රටවල් දෙකෙහි ශ්‍රම ඒකක 100 බැගින් යිටි නම් සහ ශ්‍රම හමුදුව කර්මාන්ත දෙක අතර සමානව බෙදහැ
ඇත්තම් ඒ ඒ රට වෙන් වෙන්ව සහ ඒකාබද්ධව නිපදවනු ලබන ගණක යන්ත්‍ර ප්‍රමාණය සහ ජංගම
දුරකථන ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02 යි)

(ආ) ගණක යන්ත්‍ර නිපදවීමේ ලා නිරපේක්ෂ වාසි ඇත්තේ කවර රටකට ද? ජංගම දුරකථන නිපදවීමේ ලා
නිරපේක්ෂ වාසි ඇත්තේ කවර රටකට ද? (ලකුණු 02 යි)

(ඉ) එක් එක් රටෙහි ගණක යන්ත්‍රයක ආවස්ථික පිරිවැය කොපමණ ද? (ලකුණු 02 යි)

(ඊ) සාපේක්ෂ වාසි සහිත භාණ්ඩය පමණක් විශේෂ ප්‍රාගුණ්‍යනය සඳහා ඒ ඒ රට තෝරාගනු ලැබුවහොත් ඒ
ඒ භාණ්ඩයේ මුළු නිමැවුම කොපමණ ද? (ලකුණු 02 යි)

(ii) වර්තමානයේ ශ්‍රී ලංකාව ද්විපාර්ශ්වීය නිදහස් වෙළෙඳ ගිවිසුම් ඇතිකරගෙන තිබෙන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) ලෝක වෙළෙඳ සංවිධානය (WTO) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? එය ජාත්‍යන්තර වෙළෙඳමට අදළ වන්නේ
කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

4. (i). කිසියම් රටක වර්ෂයක් තුළ සිදු වූ විදේශීය ගණුදෙනුවල සාරාංශයක් පහත දක්වේ.

| අයිතමය | වටිනාකම (රුපි. බිලියන) |
|---|---|
| ආදායම් ලැබීම් | 30 |
| ආදායම් ගෙවීම් | 70 |
| භාණ්ඩ ආනයනය | 1,000 |
| පෞද්ගලීකරණ ලැබීම් | 10 |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 200 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 15 |
| ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) | 40 |
| පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධනය ගෙවීම් | 30 |
| සේවා (ශුද්ධ) | 25 |
| භාණ්ඩ අපනයන | 700 |
| පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධනය ලැබීම් | 40 |
| සෘජු විදේශීය ආයෝජන (ශුද්ධ) | 50 |
| රජයේ දිගුකාලීන ප්‍රාග්ධනය ලැබීම් | 55 |
| රජයේ දිගුකාලීන ප්‍රග්ධනය ගෙවීම් | 25 |

(අ) වර්තන ගිනුමේ ශේෂය කොපමණ ද? (ලකුණු 03 යි)

(ආ) ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ශේෂය කොපමණ ද? (ලකුණු 03 යි)

(ඉ) සමස්ත ශේෂය කොපමණ ද? (ලකුණු 03 යි)

(ii) නිදහසේ පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් තුළ විනිමය අනුපාතිකය තීරණය වීමේ ලා බලපාන
සාධක කවරේ ද? (ලකුණු 06 යි)



www.pastpaperlk.com www.artsapi.lk

## "ආ" කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

(i) "ආර්ථික වෘද්ධිය" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ආර්ථික වෘද්ධිය හටගැනීමට බලපාන ප්‍රධාන හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ආර්ථික වෘද්ධිය තුළින් ජීවිතයේ ගුණාත්මක තත්ත්වය උසස් කරවීම සඳහා අවශ්‍ය කරන කොන්දේසි කවරේද? (ලකුණු 04 යි)

(iv) රටවල් අතර ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය සැසඳීම, ආර්ථික ශුභ සිද්ධියේ වෙනස්කම් පිළිබිඹු කෙරෙන පරිපූර්ණ මිනුමක් නොවන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

6. (i) දිළිඳු ජනතාවට හිතකර වෘද්ධිය (pro-poor growth) යනුවෙන් කවරක් අදහස් වේ ද? (ලකුණු 05 යි)

(ii) දිළිඳු ජනතාවට හිතකර වෘද්ධිය ළඟාකර ගත හැක්කේ කෙසේ ද? (ලකුණු 05 යි)

(iii) දිළිඳු ජනතාවට හිතකර වෘද්ධිය ළඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ රජය මෑත කාලය තුළ ගෙන ඇති පියවර කවරේ ද? (ලකුණු 05 යි)

7. 1995 දී ආරම්භ කරන ලද සමෘද්ධි වැඩසටහන ශ්‍රී ලංකාවේ දිළිඳු ජනතාව සඳහා ඇති විශාලතම ශුභසාධන වැඩසටහන වේ.

(i) සමෘද්ධි වැඩ සටහනේ ප්‍රධාන අංග ලක්ෂණ කවරේ ද? (ලකුණු 05 යි)

(ii) සමෘද්ධිය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමීය සංවර්ධන වැඩසටහනෙහි ප්‍රධාන සංඝටක පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iii) දරිද්‍රතාවය තුරන්කිරීමේ උපාය මාර්ගයක් වශයෙන් සමෘද්ධි වැඩසටහනෙහි දක්නට ලැබෙන ප්‍රධාන සීමාකම් විචාරාත්මක ව විමසන්න. (ලකුණු 05 යි)

8. "මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වෘද්ධිය කෙරෙහි 50% කට වඩා වැඩි දායකත්වයක් සපයා ඇත්තේ සේවා අංශයයි."

(i) දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතියට අනුව සේවා අංශයට ඇතුළත් ප්‍රධාන උප අංශ නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) 2001 - 2005 කාලය තුළ සේවා අංශය විසින් දළ දේශීය නිෂ්පාදිතයට සපයන ලද දායකත්වය වාර්ෂිකව වෙනස් වී ඇත්තේ කෙසේ ද? (ලකුණු 05 යි)

(iii) කෘෂිකර්මය හා කර්මාන්ත යන අංශවලට සාපේක්ෂව සේවා අංශය තවදුරටත් ප්‍රසාරණය වීම තිරසාර ආර්ථික වෘද්ධියක් ළඟා කර ගැනීමේ ලා හිතකරවේ ද? (ලකුණු 06 යි)

❊ ❊ ❊

www.pastpaperlk.com
www.artsapi.lk